**පුත්තලම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 26 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**---------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වාහන 02ක වටිනාකම් තක්සේරුකර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.633,500 ක් වූ වාහනයක් රු.896,320 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) රු.634,760 ක් වූ අක්‍රීය තත්ත්වයේ පවත්නා යන්ත්‍රෝපකරණ තොගයක් ස්ථාවර වත්කම්වලට ඇතුළත් කර තිබුණි.

(ඈ) දේශපාලන අධිකාරියේ හතරදෙනෙකුට ලබාදී තිබූ රු.153,101 ක් වූ වත්කම්වල අගය දිගින් දිගටම ස්ථාවර වත්කම් යටතේ පෙන්වීම නිසා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වීම සිදුව තිබුණි.

#### 1.3.2 නොසැසඳුන පාලන ගිණුම්
**-----------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ආදායම් ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන්ගේ එකතුව රු.5,035,229 ක් වූ අතර, ඒවාට අදාල උපයෝගී ලේඛනවල ශේෂ එකතුව රු.4,476,446 ක් වූයෙන් රු.558,783 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.3.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු ගිණුම්
-------------------

i. 2016 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.94,384,860 ක් වූ අතර, එම මුදලින් වර්ෂයක කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.35,756,214 ක් විය.

ii. සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු ගණනාවක සිට අයනොවී පවතින ජංගම වත්කම්වල අගය රු.918,287 ක් විය.

iii. 2014 ඔක්තෝබර් සිට ස්ථිර කරන ලද කාර්ය මණ්ඩලය වෙනුවෙන් වූ රු.17,573,101 ක වැටුප් ප්‍රතිපූර්ණයක් 2017 මාර්තු මාසය වන විටද ලැබී නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු එකතුව රු.1,124,826 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

ගිණුම් විෂයයන් 06 කට අදාල එකතුව රු.216,213,030 ක් වූ වත්කම් හා වගකීම් ශේෂ සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකල අතර, සමාලෝචිත වර්ෂයේ විනාශ කිරීමට හා වෙන්දේසි කිරීමට යෝජිත භාණ්ඩ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකරන ලදි.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2002 අංක 14 දරන එකතුකල අගය මත බදු පනත | වර්ෂ ගණනාවක සිට එකතු කරගෙන තිබූ රු.946,880 ක්වූ එකතුකල අගය මත බදු මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,446,633 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,576,410 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

රු.12,870,223 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි වෙනත් අයහාර ලැබීම්වල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම් රුපියල් මිලියන 42 ක් වූ අතර, එයින් රුපියල් මිලියන 21 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,079,434 ක් වූ හිඟ බදුවලින් වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟව ඇති වරිපනම් බදු වටිනාකම සියයට 93ක් හා අක්කර බදු වටිනාකම සියයට 79 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී මුදල රු.242,797 ක් විය.

**2.3.2 වරිපනම් බදු**

--------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,780,035 ක් වූ හිඟ වරිපනම් බදුවලින් වර්ෂ 01ට වැඩි හිඟයේ එකතුව රු.3,079,434 ක් විය.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තිය ප්‍රකාරව දේපල තහනම් කිරීමේ ක්‍රියාවලියට හෝ ඒ පිළිබඳ නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**2.3.3 බදු කුලී හා කඩ කුලී**

----------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,198,205ක් හා රු.242,797 ක් වූ පිළිවෙලින් හිඟ බදු කුලී හා හිඟ කඩ කුලීවලින් වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ බදු කුලී සහ කඩ කුලී පිළිවෙලින් රු.4,184,565 ක් සහ රු.24,475 ක් විය.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

වර්ෂ 03කට වැඩි කාලයක් පැරණි උසාවි දඩ රු.4,295,299 ක් අයවිය යුතුව තිබුණි. පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් 2015 මැයි සිට නොවැම්බර් දක්වා කාලයට අදාල රු.8,247,433 ක සහ රු.7,403,913 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධන ඇගයීම**

------------------------

2016 වර්ෂය සඳහා වූ කාර්ය සාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 සිට 2013 දක්වා කාලයට අදාලව පුද්ගලයින් හා ආයතන 12 කට සභාව සතු මෝටර් ග්‍රේඩරය කුලියට ලබාදීම වෙනුවෙන් එකතුව රු.581,272 ක් අයවීමට තිබුණි. මෙම හිඟ මුදල් අයකර ගන්නා ලෙස 2016 ඔක්තෝබර් 13 දිනැති පළාත් අරමුදල් ගිණුම් කාරක සභාවෙන් නියෝග කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) මදුරන්කුලිය තොඩුවාව පාර අංක 17 දරන කඩ කාමරයේ බදුකුලී ගෙවීම පැහැරහරිමින් කඩ කාමරයේ අයිතිය බදුකරු සතුකර ගැනීමට පුත්තලම දිසා අධිකරණයේ පවරා තිබූ නඩුවට සභාව ඉදිරිපත් වී නොතිබුණු අතර, බදුකරුට පක්ෂව ලැබූ තීන්දුවට එරෙහිව කරුණු ඉදිරිපත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ දේශපාලන අධිකාරියේ හිටපු සාමාජිකයන් දෙදෙනෙකුට ලබාදී තිබුණු රු.152,845 ක් වූ දුරකථන 06 ක් සම්බන්ධයෙන් සුදුසු ලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවය හැර යාම, විශ්‍රාම යාම, මියයාම හා වැඩතහනම් කිරීම ආදි හේතු මත එකතුව රු.602,151 ක් වු සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිවිසුම්ගත අගය රු.8,252,999 ක් වු "පිළිසරු" ව්‍යාපෘතියෙහි රු.602,320 ක් වු ආරක්ෂිත වැට නියමිත ප්‍රමිතියට ඉදිකර නොතිබු අතර, රු.97,000 ක් වු නළ ළිඳ ඉදිකිරීම ආරම්භකර නොතිබුණි.

(ආ) "පිළිසරු" ව්‍යාපෘතියෙහි ඉදිකිරීම ප්‍රමාදවීම හේතුවෙන් සභාව විසින් 2014 නොවැම්බර් මාසයේදී ගිවිසුම අවලංගුකර තිබියදී 2016 මාර්තු මාසයේදී රු.300,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර, පසුව එම මුදල කොටස් ගෙවීමක් වශයෙන් සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

රු.634,760 ක්වු යන්ත්‍රෝපකරණ තොගයක් අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

### 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

වර්ෂ 04 කට පමණ පෙර ඉදිකිරීම් ආරම්භ කර තිබෙන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රු.3,178,632 ක් වැයකර තිබුණද, ඉදිකිරීම් නිම නොවීම සහ යන්ත්‍ර සවි නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. සභා බලප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ ටොන් 5 – 6 ක් සභාව සතු ඉඩමකට විවෘතව බැහැර කිරීම පරිසර හානියක් මෙන්ම මහජන සෞඛ්‍ය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිව තිබුණි.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 68 ක් වු වුවද, දැනට 100 දෙනෙකු සේවයේ නිරතව තිබුණි. ද්විතීක තනතුරු 04 ක හා ප්‍රාථමික තනතුරු 03 ක් පුරප්පාඩු වී ඇති අතර, අනියම්/ආදේශක තනතුරු 13 කට අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව 13 දෙනෙකු බඳවාගෙන තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම

වයඹ ප්‍රධාන ලේකම්ගේ 2010 ඔක්තෝබර් 05 දිනැති අංක ව/ප්‍රාලේ/05/03/විගණන කමිටු දරන ලිපිය අනුව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේ දී අනාවරණය වු පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ අඩුපාඩු වරින්වර මාගේ විගණන විමසුම් මඟින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| | ---------- | | ------------- |
| (අ) | වත්කම් පාලනය | | වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) | ආදායම් ආධාර | | පළාත් පාලන කොමසාරිස්ගෙන් හා වයඹ පළාත් සභාවෙන් නිසි වේලාවට මුදල් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. |
| (ඇ) | ආදායම් පාලනය | | අයවිය යුතු ආදායම් නිසි කලට අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | ගිණුම්කරණය | i. | ආදායම්/වියදම් නිසි පරිදි ගිණුම්ගත කිරීම සිදුකර නොතිබුණි. |
| | | ii. | තීරණ පොත නියමිත පරිදි පවත්වාගෙන නොයැම |
| | | iii. | මුද්දර ගාස්තු, උසාවි දඩ, කුලී ආදායම් ආදී ලේඛන නඩත්තු කර නොතිබුණි. |
| (උ) | වාහන පාලනය | | වාහන අළුත්වැඩියාව/ ඉන්ධන නිකුත් කිරීම නිසි පරිදි ක්‍රමානුකූලව සිදු නොකිරීම. |
| (ඌ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම අත්හිටුවා තිබෙන තත්ත්වය තුල දෛනිකව එක්රැස්වන කසළ පරිසර හිතකාමී අයුරින් බැහැර නොකිරීම. |